# SRI LANKAN ECONOMIC STRUCTURE

# &

# ECONOMIC POLICIES

# (Part-III)

***S. Madushanka***

***B.Sc (Mgt) Accounting (Special) (U.G)***

***University of Sri Jayewardenepura***

# <u>ආර්ථිකයක ක්‍රියාකාරීත්වයට බලපාන දේශීය හා විදේශිය සංසිද්ධි</u>

වර්තමාන ලෝකයේ සෑම රටක් ම බාහිර ලෝකයට විවිධ ප්‍රමාණවලින් විවෘත ව පවතී. එනම් ආවෘත ආර්ථිකයන් දක්නට නැත.

එම නිසා ආර්ථිකයක ක්‍රියාකාරීත්වයට දේශීය සංසිද්ධි මෙන් ම ගෝලීය සිදු වීම් ප්‍රබල බලපෑමක් ඇති කරනු ලබයි.

මෙහි දී දේශීය හා ගෝලීය සිදු වීම් ආර්ථිකයේ විවිධ අංශ වෙත සෘජුව ම හෝ වක්‍ර ලෙස බලපෑම් ඇති කරයි.

ClassWork.LK

එනම් සාර්ව ආර්ථිකයේ,

- නිෂ්පාදනය
- සේවා නියුක්තිය
- මිල මට්ටම
- පොළී අනුපාතිකය
- අන්තර් ජාතික වෙළෙඳාම
- ගෙවුම් ශේෂය
- විදේශ විනිමය අනුපාතිකය
- ප්‍රාග්ධන වෙළෙඳපොළ යන අංශ කෙරෙහි බලපෑම් ඇති කරයි.

ClassWork.LK

# ආර්ථිකයට බලපාන දේශීය සිදු වීම්

ආර්ථිකයට බලපාන දේශීය සිදු වීම්වලට නිදසුන් කිපයක් පහත දැක්වේ.

## ආණ්ඩු බලය වෙනස් වීම

1977 බලයට පත් වූ නව රජය ක්‍රියාත්මක කළ විවෘත ආර්ථික ප්‍රතිපත්ති නිසා විදේශ වෙළෙඳ රටාව, දේශීය වෙළෙඳ රටාව, කර්මාන්ත ව්‍යුහය, මූල්‍ය හා බැංකු පද්ධතිය මුළුමනින් ම වෙනස් විය.

1994 ආණ්ඩු බලය වෙනස් වීම් සමඟ ඇති වූ ආර්ථික ප්‍රතිපත්තිමය වෙනස් වීම් නිසා ආර්ථිකය ගමන් කළ දිශාව කිසියම් ප්‍රමාණයකින් වෙනස් විය.

එනම් ආර්ථිකයේ විවෘත භාවය ඉතා සුළු ප්‍රමාණයකින් අඩු කිරීම, පෞද්ගලීකරණ ප්‍රතිපත්ති වෙනස් කිරීම, මිල ස්ථායිතාව, සේවා වියුක්ති ගැටලු අවම කිරීම, නීතිය හා සාමය තව දුරටත් ශක්තිමත් කිරීම ආදි වශයෙන් කාලීන වෙනස්කම් ගණනාවක් සිදු විය.

2006 වර්ෂයේ දී ආණ්ඩු බලය වෙනස් වීම මත දේශීය ආර්ථිකය ශක්තිමත් කිරීමේ නව ආර්ථික ප්‍රතිපත්ති හා ගැළපුම් ක්‍රියාත්මක කිරීම සිදු විය.

ClassWork.LK

## දේශීය කෘෂිකාර්මික අංශය ශක්තිමත් කිරීම

## පෞද්ගලීකරණ වැඩ පිළිවෙළ සීමා කිරීම

2015 ආණ්ඩු බලය වෙනස් වීමත් සමග නීතියේ ආධිපත්‍ය තහවුරු කිරීම, සමාජීය වෙළෙඳපොළ ආර්ථිකයක් කරා නැඹුරු වීම, යහපාලනය පිළිබඳ කතිකාව, ජාතික ඒකාබද්ධතාවක් ඇති කිරීම, පුනර්ජනනීය බලශක්ති ප්‍රභවයන් වෙත ප්‍රවේශ වීම ආදි වෙනස්කම් සිදු විය.

1983 සිට 2009 දක්වා (අවුරුදු 30) පැවති යුද තත්ත්වය මේ නිසා රටේ යටිතල පහසුකම්. කර්මාන්ත ශාලා, කෘෂිකාර්මික ගොවිබිම් විනාශ වූ අතර, නිෂ්පාදනය පහළ වැටිණි. විරැකියාව වැඩි විය. දේශීය සම්පත් ඌන උපයෝජනයට ලක් විය. රජයට ආරක්ෂක කටයුතු වෙනුවෙන් විශාල වියදමක් දැරීමට සිදු විය.

1989 සිට 1991 දක්වා දිවයිනේ සෙසු ප්‍රදේශවල පැවති සිවිල් අරගල සිදු වීම ද රටේ නිෂ්පාදනය පහළ යාමට මිල මට්ටම ඉහළ යාමට, දේපොළ සම්පත් හා යටිතල පහසුකම් විනාශ වීමට හේතු විය.

ClassWork.LK

## වරින් වර ඇති වූ ස්වාභාවික උපද්‍රව

- 2004 වර්ෂයේ ඇති වූ සුනාමි තත්ත්වය
- වරින් වර ඇති වූ ගංවතුර හා නායයාම්
- වරින් වර ඇති වූ නියඟ තත්ත්වයන්
- වන සතුන්ගෙන් ඇති වන හානි

ClassWork.LK

## ආර්ථිකයට බලපෑ ගෝලීය සිදු වීම්

ආර්ථිකයට බලපෑ ගෝලීය සිදු වීම් සඳහා පහත සඳහන් නිදසුන් දැක්විය හැකි ය.

- **ආසියාතික මූල්‍ය අර්බුදය**

මේ නිසා අග්නිදිග ආසියා කලාපයේ මූල්‍ය වෙළෙඳපොළ දැඩි පීඩනයකට ලක් වීම නිසා හා එම කලාපයේ විදේශ ව්‍යවහාර මුදල් ඒකක දැඩි ලෙස අවප්‍රමාණය විය.

මේ නිසා රුපියල අවප්‍රමාණය වීම, එම කලාපයෙන් ආනයනය කරන භාණ්ඩ මිල ගණන් ඉහළ යාම සිදු විය.

- **යුරෝපා ආර්ථික අර්බුදය**

2006 වසරේ සිට ඇමරිකානු හා යුරෝපා කලාපවල ඇති වූ ආර්ථික අවපාතය නිසා එම කලාපයේ නිෂ්පාදනය පහළ ගිය අතර, විරැකියාව වැඩි විය. මිල මට්ටම් ශීඝ්‍රයෙන් ඉහළ ගියේ ය. දැඩි රාජ්‍ය ණය අර්බූදයක් හට ගැණිනි. මෙය ශ්‍රී ලංකාවේ අපනයන වෙළෙඳපොළ, විදේශ සේවා නියුක්තිය, විදේශ ආයෝජන අඩු වීම කෙරෙහි විශාල බලපෑමක් ඇති කෙරිණ.

Classwork.LK

ගෝලීය ආර්ථිකයේ රටවල් අතර දිගින් දිගට ම ඇති වූ අර්බුදයන් විශේෂයෙන් ඉරාකය, ඇෆ්ගනිස්ථානය, සිරියාව, ආදී රටවල ඇති වූ යුද ගැටුම් නිසා ඛනිජ තෙල් මිල ඉහළ යාම ශ්‍රී ලංකාවේ ආපනයන වෙළෙඳපොළ පහළ යාම, විදේශ ආයෝජන අඩු වීම සිදු විය.

- **<u>ලෝකයේ ඛනිජ තෙල් හා රන් මිල ගණන් ඉහළ යාම.</u>**

මේ නිසා ලංකාවේ ආනයන වියදම ඉහළ යාම, ගෙවුම් ශේෂ හිඟය, රුපියලේ විදේශ අගය පහළ යාම, බලශක්තිය හා බැඳුනු උද්ධමනය ඉහළ යාම, ශ්‍රී ලංකාවේ ආර්ථිකය කෙරෙහි බලපා ඇත.

ClassWork.LK

- <u>ලෝක ආහාර හිඟය</u>

2000 වසරේ මුල් වකවානුවේ දී ලෝකයේ ආහාර නිෂ්පාදනය කරන රටවල්වල ඇති වූ බලපෑම නිසා සහ ඉන්ධන නිෂ්පාදනයට ආහාර විශාල වශයෙන් භාවිත කිරීම නිසා දැවැන්ත ආහාර හිඟයක් ඇති විය.

එහි ප්‍රතිඵලයක් ලෙස ශ්‍රී ලංකාවට ආනයනය කරන තිරිඟු පිටි, කිරි පිටි, සීනි ආදී ආහාර මිල ගණන් ශීඝ්‍රයෙන් වැඩි විය.

ගෝලීය උෂ්ණත්වය ඉහළ යාම හා විවිධ කලාපවල ඇති වූ ස්වාභාවික උපද්‍රව ශීඝ්‍ර කාර්මීකරණයත් සමඟ ගෝලීය අවකාශයට මුදා හැරෙන අහිතකර වායුන් නිසා ගෝලීය උෂ්ණත්වය ශීඝ්‍රයෙන් ඉහළ යාමෙන් ග්ලැසියර් දියවීමෙන් සාගර ජල මට්ටම ඉහළ යාම සිදු වේ.

එමෙන් ම සාගර සම්පත් විනාශ වීම, බෝග ඵලදාව අඩු වීම ද මේ නිසා සිදු වේ. කෘෂි කාර්මික රටක් වශයෙන් ශ්‍රී ලංකා ආර්ථිකය කෙරෙහි මෙම තත්ත්වය විශාල ලෙස බලපෑම් ඇති කරයි.

ClassWork.LK

2021
2022
2023

# උසස් පෙළ

ගිණුම්කරණය
ආර්ථික විද්‍යාව
ව්‍යාපාර අධ්‍යයනය

2021
2022

# සාමාන්‍ය පෙළ

ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය

## තනි හෝ කණ්ඩායම් පන්ති
## (English & Sinhala Medium)

# 0763655550

S. Madushanka
B.Sc (Mgt) Accounting (Special) (U.G)
University of of Sri Jayewardenepura